the global voice of
the legal profession



# නීත්‍යානුකූලභාවය පිළිබඳ අර්බුදයක්: අගවිනිසුරු බණ්ඩාරනායකට එරෙහි දෝෂාභියෝගය සහ ශ්‍රී ලාකාවේ

විධායක සාරාංශය

**2013 මාර්තු**

International Bar Association’s Human Rights Institute (අන්තර්ජාතික නීතිඥ සංගමයේ මානව අයිතිවාසිකම් ආයතනයේ, IBAHRI) වාර්තාවක්

මෙම වාර්තාව ලුන්ඩ් - ලන්ඩන් මාර්ගෝපදේශ 2009 අනුව සම්පාදනය කර ඇත
(**www.factfindingguidelines.org**)

International Bar Association (අන්තර්ජාතික නීතිඥ සංගමය, IBA) වෙත ගෞරවය ලබා දෙන්නේ නම්,
මෙම වාර්තාවේ අන්තර්ගත කරුණු කිසිදු අවහිරයකින් තොරව උපුටා දැක්වීම හෝ නැවත මුද්‍රණය කළ හැකිය

**International Bar Association**
4th Floor, 10 St Bride Street
London EC4A 4AD, United Kingdom
දුරකථන: +44 (0)20 7842 0090
ෆැක්ස්: +44 (0)20 7842 0091
වෙබ් අඩවිය **www.ibanet.org**

# නීත්‍යානුකූලභාවය පිළිබඳ අර්බුදයක්: අගවිනිසුරු බණ්ඩාරනායකට එරෙහි දෝෂාභියෝගය සහ ශ්‍රී ලංකාවේ

## විධායක සාරාංශය

ශ්‍රී ලංකාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය අර්බුදයට මුහුණපාමින් සිටී. ශ්‍රී ලංකාවේ අභියාචනාධිකරණය මගින් ලබා දෙන ලද ඒකාර්ථබක තීන්දුවට පටහැනිව, ශ්‍රේෂ්ඨාධිකරණයේ වසර 14ක කාලයක් රැඳී සිටි කාන්තාවක් වූ, එරට 43වැනි අගවිනිසුරුවරිය රටේ පාර්ලිමේන්තුව සහ ජනාධිපතිවරයා විසින් ඉවත් කර ඇත. වඩාත් මෑතක දී නීතිපතිවරයා සහ කැබිනට් මණ්ඩලයේ නෛතික උපදේශකවරයා වශයෙන් වසර කීපයක් තිස්සේ ශ්‍රී ලංකා ආණ්ඩුවට සේවය කළ නීතිඥයෙක් මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා විසින් අගවිනිසුරු බණ්ඩාරනායක මහත්මියගේ ධුරය දැරීමට තෝරා ගෙන ඇත. මේ අතර, ඇගේ ඉවත් කිරීමට විරුද්ධ වූ පුද්ගලයන් නාඳුනන තැනැත්තන්ගෙන් එල්ලවන හිරිහැර, බියගැන්වීම් සහ තර්ජනවලට භාජනය වී ඇත. වසර ගණනාවක් තිස්සේ විධායක විසින් අධිකරණ ක්ෂේත්‍රයට අයුතු මැදිහත්වීම් සිදු කිරීම, සහ කලාතුරකින් විමර්ෂණයට භාජනය වූ සහ කෙදිනකවත් නඩු පැවරීමක් නොකරන ලද ආණ්ඩුවේ විවේචකයන්ට එරෙහිව සිදු කරන ලද පහරදීම්, පැහැරගෙන යෑම් සහ මිනීමැරුම් මාලාවට පසුව මෙය සිදු විය.

මෙම පසුබිම තුළ, බණ්ඩාරනායක අගවිනිසුරුවරිය ඉවත් කිරීම සුළු දේශපාලන ආරවුලක් පමණක් නොවේ; එමගින් ශ්‍රී ලංකාව තුළ දැනටමත් දුර්වල මට්ටමක ඇති නීතියේ පාලනය පිළිබඳව ජනතාව සතු විශ්වාසය යටපත් කරනු ලබන අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල අයිතිවාසිකම්වල ස්වාධීන භාරකරුවා ලෙස රටේ අධිකරණය සතු බලය අහිමි කිරීමට ද තර්ජනයක් වේ. International Bar Association's Human Rights Institute (අන්තර්ජාතික නීතිඥ සංගමයේ මානව අයිතිවාසිකම් ආයතනය, IBAHRI) විසින් නිරීක්ෂණය කරනු ලබන පරිදි, බණ්ඩාරනායක මහත්මිය ඉවත් කිරීමට ගත් තීරණය මෑතකදී ප්‍රසිද්ධ කරන ලද පොදුරාජ්‍ය මණ්ඩලීය ප්‍රඥප්තිය මගින් තහවුරු කර ඇති බලතල බෙදීම, නීතියේ පාලනය, යහ පාලනය සහ මානව අයිතිවාසිකම් සඳහා ගරු කිරීම ඇතුළු පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල මූලික වටිනාකම් සහ මූලධර්මවලට ද පරස්පර විරෝධී වේ. මෙම හේතුව නිසා, 2013 නොවැම්බර් මස ශ්‍රී ලංකාවේ, කොළඹදී පැවැත්වීමට දැනට නියමිත පොදුරාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක රැස්වීමේ කටයුතු ඉදිරියට රැගෙන යාම පිළිබඳ කටයුතු තීරණය කිරීමේදී, පොදු රාජ්‍ය මණ්ඩලය විසින්, විශේෂයෙන්ම, වාර්තාවේ 9-10 දක්වා වූ නිර්දේශ සහ මෙම වාර්තාව සුපරීක්ෂාකාරීව සලකා බලන ලෙස අන්තර්ජාතික නීතිඥ සංගමයේ මානව අයිතිවාසිකම් ආයතනය (IBAHRI) විසින් පොදුරාජ්‍ය මන්ඩලයට (Commonwealth) ආරාධනා කරනු ලබයි.

### අන්තර්ජාතික නීතිඥ සංගමයේ මානව අයිතිවාසිකම් ආයතනයේ (IBAHRI) වාර්තාව

මෙම සිදුවීම් සඳහා වූ කඩිනම් ප්‍රතිචාරයක් ලෙස අන්තර්ජාතික නීතිඥ සංගමයේ මානව අයිතිවාසිකම් ආයතනය (IBAHRI) විසින් මෙම වාර්තාව පළ කරනු ලැබේ. නයිජීරියානු ෆෙඩරල් ජනරජයේ හිටපු අගවිනිසුරුවරයෙක් වූ, ගරු විනිසුරු මුහමඩ් ලවාල් උවෙස්; විනිසුරුවරුන්ගේ සහ නීතිඥයන්ගේ ස්වාධීනත්වය පිළිබඳ එක්සත් ජාතීන්ගේ (UN) පළමු විශේෂ වාර්තාකරු වූ, දාතෝ පරම් කුමාරස්වාමි; බ්‍රිතාන්‍ය අධිනීතිඥවරයෙක් සහ මෙහෙයුම් වාර්තාකරු වූ, සදාකත් කද්‍රි; සහ අන්තර්ජාතික නීතිඥ සංගමයේ මානව අයිතිවාසිකම් ආයතනයේ (IBAHRI) වැඩසටහන් නීතිඥවරයා ව, ෂේන් කීනන් යන අය ඇතුළත්:නියෝජිත මණ්ඩලයක් විසින් එය රචනා කර ඇති

මෙම නියෝජිත මණ්ඩලය පත් කරනු ලැබූ දෙවැන්න වේ. (ඉන්දියාවේ හිටපු අගවිනිසුරු ජේඑස් වෙර්මා සහ බ්‍රිතාන්‍ය සාමි මන්ත්‍රී මණ්ඩලයේ බැරන්වරියක් වන උෂා කුමාරි ප්‍රශාර් යන) තවත් දෙදෙනෙක් සමසග සදාකත් කද්‍රි සහ ෂේන් කීනන් යන නියෝජිතයන් යැවීමට අන්තර්ජාතික නීතිඥ සංගමයේ මානව අයිතිවාසිකම් ආයතනය (IBAHRI) මුල් අවස්ථාවේදී අදහස් කරනු ලැබුව ද, එම සියලු දෙනාටම ශ්‍රී ලංකාවට ඇතුළුවීම සඳහා වීසා ලබාදීමට ප්‍රතික්ෂේප කරන ලදී. ශ්‍රී ලාංකික ආණ්ඩුව සමග මෙම දුෂ්කරතාව විසඳාගැනීමට අන්තර්ජාතික නීතිඥ සංගමයේ මානව අයිතිවාසිකම් ආයතනය (IBAHRI) දරනු ලැබූ උත්සාහයන් අසාර්ථක වූ අතර, එබැවින්

වර්තමාන නියෝජිත මණ්ඩලයේ සාමාජිකයන්ට පර්යේෂණ සිදු කර රටෙන් බැහැරව සිට මෙම වාර්තාව ලිවීමට සිදු විය. මීට පෙර එක් අවස්ථාවකදී පමණක්, එනම් මෑතක දී සිදු වූ රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණයක නෛතික ප්‍රතිඵල විමර්ශණය කිරීමට අන්තර්ජාතික නීතිඥ සංගමයේ මානව අයිතිවාසිකම් ආයතනය (IBAHRI) වෙත අවසර දීම ෆිජී රාජ්‍ය විසින් 2008 වසරේදී ප්‍රතික්ෂේප කරන ලද අවස්ථාවේ දී එවැනි සිදුවීමක් හට ගෙන ඇත. කෙසේ වුවද, එම නියෝජිත මණ්ඩලය විසින් එම අවස්ථාවේදී, වාර්තාවක් ලියන ලද අතර, 2009 වසරේදී පොදු රාජ්‍ය මණ්ඩලයෙන් (Commonwealth) ෆිජී රාජ්‍ය තාවකාලිකව ඉවත කිරීමට ටික දිනකට පෙර එය ප්‍රකාශයට පත් කරන ලදී.

ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා අන්තර්ජාතික නීතිඥ සංගමයේ මානව අයිතිවාසිකම් ආයතනයට (IBAHRI) නොහැකි වීම පැහැදිලිවම පෙනී යන සංවිධානාත්මක දුෂ්කරතා කීපයක් ඇති කරන ලද අතර, ඒ අනුව එම නියෝජිත මණ්ඩලයට ඒ සම්බන්ධව උනන්දුවක් දක්වන්නා වූ පාර්ශ්ව සමග සාකච්ඡා කිරීමට නොහැකි විය. කෙසේ වුවද, එම ආයතනය විසින් රට තුළ සිටින විනිසුරුවරුන්, නීතිඥයන්, ජනමාධ්‍යවේදීන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන් ඇතුළු ප්‍රධාන පුද්ගලයන් 20 දෙනෙක් පමණ පිරිසක් සමග දුරකථන සහ අන්තර්ජාලය ඔස්සේ දීර්ග ලෙස සාකච්ඡා මාලාවක් පවත්වන ලදී. මේ සඳහා සහභාගිවීමට ශ්‍රී ලංකා ආණ්ඩුවට ද ආරාධනා කරනු ලැබුවද, සම්මුඛ සාකච්ඡා සඳහා හි ඉල්ලීම එම ආණ්ඩුව මගින් ප්‍රතික්ෂේප කරන ලදී.

වාර්තාව මගින් ගැටළු දෙකක් පිළිබඳව සැලකිල්ල යොමු කරයි: බණ්ඩාරනායක අගවිනිසුරු ඉවත් කිරීම (දෙවැනි පරිච්ඡේදය); සහ ශ්‍රී ලංකාවේ නීති වෘත්තියේ අන්තරායකර තත්ත්වය (තෙවැනි පරිච්ඡේදය). මෙම වාර්තාවෙන් පෙන්වා දෙන පරිදි, මෙම ගැටළු දෙක එකිනෙකට බෙහෙවින් සම්බන්ධ ඒවා වේ. අධිකරණ ස්වාධීනත්වය සහ නීතිඥ වෘත්තියේ අවංක නියැලීම දශකයකටත් වැඩි කාලයක් වැඩි කාලයක් තිස්සේ පීඩනයකට ලක් වී ඇති අතර, 2009 වසරේ මැයි මාසයේ දී දෙමළ ඊලාම් විමුක්ති කොටි සංවිධානයට (LTTE) එරෙහිව දිනා ගන්නා ලද ජයග්‍රහණය මඟින් ජනතාව බලාපොරොත්තු වූ ආකාරයේ තුලනාත්මක ආණ්ඩුවක ප්‍රතිසංස්ථාපනයක් ගෙනදීමට සමත් නොවීය. සත්‍ය වශයෙන්ම කියතොත්, විධායකයේ අයුතු මැදිහත්වීම් ඉහළ ගොස් ඇති අතර දැනටමත් නීතියේ පාලනයට අපරිමිත හානියක් සිදු කරන ලද ක්‍රියාවලියක මුදුන් පැමිණීමක් ලෙස අගවිනිසුරුවරියට සිදු කරන ලද අයුතු සැලකිල්ල මේ අනුව දැකිය යුතුය.

### *ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය පසුබිම*

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවසථාව 1978 වසරේ දී නීතිගත කර ගැනීමේ සිට විධායකයෙන්, ව්‍යවස්ථාදායකයෙන්, සහ අධිකරණ පද්ධතියේම සිටින ඉහළ නිලධාරීන්ගෙන් විනිසුරුවන්ට එරෙහිව එල්ලවන පීඩනයට විරුද්ධව ඔවුන් ආරක්ෂා කිරීම සඳහා එම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රමාණවත් නොවන බවට විවේචන එල්ල විය. අධිකරණ නිලධාරීන් පත් කිරීම, මාරු කිරීම, විනය කටයුතු සහ ඔවුන් ඉවත් කිරීම සඳහා පාරදෘශ්‍ය සහ වගවීමේ ක්‍රියාවලීන් නොමැතිවීම හේතුවෙන් ඔවුන්ගේ ධූර කාලය පිළිබඳ ආරක්ෂාව විශේෂයෙන්ම අනතුරට භාජනය වී ඇත.

මෙම සුරැකිතාවන් නොමැතිවීම අන්තර්ජාතික නීතිඥ සංගමයේ මානව අයිතිවාසිකම් ආයතනය (IBAHRI) විසින් 2011 වසරේ දී කරන ලද සිය පළමු සංචාරයේ දී අවධානය යොමු වූ බරපතල කරුණක් විය. පසුකාලීනව සිදු කරන ලද 17 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ජ්‍යෙෂ්ඨ විනිශ්චයකාරකවරු සහ අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන් ඇතුළු, ප්‍රධාන රාජ්‍ය නිලධාරීන් පත් කරනු ලබන ස්වාධීන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් සඳහා විධිවිධාන සලස්වන ලද නමුත්, 2005 වසරින් පසු මෙම ආයතනයේ කටයුතු තාවකාලිකව ඇණ හිටුවීමට සලස්වන ලදී. 2009 වසරේදී, අන්තර්ජාතික නීතිඥ සංගමයේ මානව අයිතිවාසිකම් ආයතනයේ (IBAHRI) ශ්‍රී ලංකාව පිළිබඳ දෙවැනි වාර්තාව මගින්, මෙය 'රටේ නීතියේ පාලනය පිළිබඳ නොවසඳුනු වඩාත් බරපතල ගැටළු අතුරින් එකක්' ලෙස සලකා ඇත.

වර්තමාන ආණ්ඩුව මඟින් මෙම නොසතුටුදායක ලෙස ක්‍රියාත්මක කළ සුරැකිතාව පවා ඉවත් කිරීමට ගත් පියවර වර්තමානයේ මතු වී ඇති අර්බුදය සඳහා වැඩි වශයෙන් දායක වී ඇත. මෑතක දී නැවත පත් වූ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ (UPFA) ආණ්ඩුව 2010 වසරේ සැප්තැම්බර් මස සම්මත කර ගන්නා ලද 18 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින්, අධිකරණ සේවා කොමිෂන් සභාව, සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ සියලු විනිසුරුවන් ඇතුළු නියෝජිතායතන අටක සාමාජිකයන් වන, ශ්‍රී ලංකාවේ ඉතාම වැදගත් නිලධාරීන්ල පත් කිරීම සඳහා වූ සීමා රහිත බලතල ජනාධිපති මහින්ද රාජපක්ෂ වෙත ලබා දෙන ලදී. විධායකය පරීක්ෂා කිරීමට පහසුකම් සැලසීම සහ විනිසුරුවන්ගේ අපක්ෂපාතීත්වය තහවුරු කිරීම සඳහා මූලිකවම අදහස් කරනු ලැබූ යාන්ත්‍රණ තවදුරටත් පෙරළා දමමින්, සිදු කරන ලද මෙම සම්මත කිරීම මඟින් රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල විධිවිධාන කැපී පෙනෙන ලෙස අසමතුලිත කර ඇත.

*බණ්ඩාරනායක අගවිනිසුරුවරිය ඉවත් කිරීම*

බණ්ඩාරනායක අගවිනිසුරුවරිය ඉවත් කිරීම සිදු වූයේ ආණ්ඩුවට එරෙහිව තීන්ද ලබා දුන් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඩුළු දෙකක මුලසුන දැරීමෙන් පසුවය. ඇය ඉවත් කිරීම සම්බන්ධ ශ්‍රී ලංකා ආණ්ඩුවේ තීරණයට මෙය බලපෑමක් වන්නට ඇති බවට සාක්ෂිකරුවන් කීපදෙනෙක් විසින් ලබා දුන් සාක්ෂි මඟින් අන්තර්ජාතික නීතිඥ සංගමයේ මානව අයිතිවාසිකම් ආයතනයට (IBAHRI) තහවුරු වේ. අදාළ කාර්යපටිපාටික රීතිවලට (ස්ථාවර නියෝග 78අ) අනුකූලබවට සලකනු ලැබූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් (සභාව) මගින් පරීක්ෂණයක් සිදු කරනු ලැබුවද එය හදිසියේ, රහසිගතව සහ ස්වාභාවික නීතියේ රීතිවලට පටහැනිව පවත්වන ලද්දක් විය. ඇය වරදකරු කිරීමට ඡන්දය දෙන ලද වැඩි පිරිස ඇය ඉවත් කිරීම සඳහා කටයුතු කළ පක්ෂයේ සාමාජිකයන් වූ අතර, සියල්ලන්ම ආණ්ඩුවේ අමාත්‍යවරු සහ නියෝජ්‍ය අමාත්‍යවරු වූහ. විවෘත සහ පාරදෘශ්‍ය කාර්යපටිපාටියක් සඳහා ඇය විසින් නැවත නැවත කරන ලද ඉල්ලීම් ඔවුන් ප්‍රතික්ෂේප කළ අතර, පිටු 989කින් යුත් ලේඛණමය සාක්ෂි පළමු වරට ඇගේ නීතිඥයන්ට පෙන්වූ විට නිසි පරීක්ෂණය ඊළඟ දිනයේ දී ආරම්භ කරනු ලබන බවට ඔවුන්ට පවසනු ලැබීය. එයට විරෝධය පෑමක් ලෙස අගවිනිසුරුවරිය ඉවත්ව ගිය අතර, සභාවේ විපක්ෂ සාමාජිකයන් හතර දෙනා ද ඉන්පසුව එලෙස ඉවත්ව යෑමෙන් පසු, ඔවුන් නොමැතිව බහුතරය විසින් සාක්ෂිකරුවන් 16දෙනෙකුගෙ න් සාක්ෂි විමසන ලදී. ඉන් පැය 12කටත් අඩු කාලයක දී, සභාව විසින් අගවිනිසුරුවරිය ධූරයෙන් ඉවත් කිරීම සාධාරනීකරණය කිරීමට තරම් බරපතල වන වැරදි හැසිරීම යන වරදට ඇය වරදකරු කරන්නා වූ පිටු 35 කින් යුක්ත වාර්තාවක් කෙටුම්පත් කර තිබුනි.

මෙම විමර්ශණය මූලික වශයෙන් දෝෂ සහගත බවට අන්තර්ජාතික නීතිඥ සංගමයේ මානව අයිතිවාසිකම් ආයතනය (IBAHRI) විසින් සලකනු ලබයි: එයට, තථ්‍ය සහ දැකිය හැකි ස්වාධීනත්වයක් නොවීය; නිර්දෝෂීභාවයේ පූර්ව නිගමනය වැරදි සහගත ලෙස නොසලකා ඇත; අගවිනිසුරුවරියට එරෙහිව යොදා ගනු ලබන සාක්ෂි පිළිබඳව ඇයට ප්‍රමාණවත් නොවන දැනුම්දීමක් කරන ලදී; එමෙන්ම එය විමර්ෂණය අවිධිමත්ව රහසිගතව පවත්වන ලදී. පොදු නීතියට සහ ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට මෙන්ම, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය සහ ආණ්ඩුවේ ශාඛා තුන පිළිබඳ පොදු රාජ්‍ය මණ්ඩලීය ('ලැටිමර් හවුස් මාර්ගෝපදේශ') ඇතුළු ශ්‍රී ලංකාව විසින් කැපවී ඇති අන්තර්ජාතික නෛතික බැඳීම්වලට නෛසර්ගික වන්නා වූ, ස්වභාවික යුක්තියේ රීති මෙය උල්ලංඝනය කරන ලදී.

*ශ්‍රී ලාංකික නීතිය යටතේ කාර්යපටිපාටියේ අනීතිකතාව*

සභාව එහි තීරණය කරා කටයුතු කරනු ලබන අතරතුර, බණ්ඩාරනායක අගවිනිසුරු වෙනුවෙන් කටයුතු කළ නීතිඥයන් විසින් අභියාචනාධිකරණයෙන් සහන අයැද සිටි අතර, 2013 ජනවාරි මස 7 වැනි දින තීන්දුවක් ලබා දීමට පෙර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ගැටළුවක් පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය ලබා ගන්නා ලදී. සභාවේ කාර්ය පටිපාටීන් නෛතිකමය වශයෙන් දෝෂ සහගත බවටත් අගවිනිසුරුවරියගේ වරදකාරීත්වය පිළිබඳ එහි තීරණය එබැවින් වලංගු නොවන බවටත් මෙම තීරණය මඟින් නියම කරන ලදී. කෙසේවුව ද පාර්ලිමේන්තුව ඇය ඉවත් කළ යුතු බවට දින හතරකට පසු නිර්දේශ කිරීමට තෝරා ගන්නා ලදී. ඉන්පසු ජනාධිපතිවරයා විසින් එම ඉවත් කිරීම පිළිබඳ තීන්දුවට අත්සන් තබන ලද අතර වහාම නව අගවිනිසුරුවරයෙක් පත් කරන ලදී. අන්තර්ජාතික නීතිඥ සංගමයේ මානව අයිතිවාසිකම් ආයතනයේ (IBAHRI) මතයට අනුව, අභියාචනාධිකරණයේ සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ ඒකාබද්ධ අධිකාරය මත ගඳී පවතින, ශ්‍රී ලංකාවේ නීතියේ පැහැදිලි ප්‍රකාශයක් නොසලකා හැරීමට ගත් මෙම තීරණය, අගවිනිසුරුගේ ඉවත්කිරීමේ නීතිවිරෝධත්වය සංයුක්ත කරවයි.

*තුලනාත්මක ක්‍රියාවලීන් සහ අන්තර්ජාතික සම්මතයන්*

බණ්ඩාරනායක අගවිනිසුරුවරිය ඉවත් කිරීමට යොදා ගත් ක්‍රියාවලිය ශ්‍රී ලංකාවේ නීතිය උල්ලංඝනය කිරීමක් මෙන්ම, ඊට අදාළ අන්තර්ජාතික සම්මතයන් නොසලකා හැරීමක් හෝ කඩකිරීමක් ද වේ. 2011 අප්‍රේල් මස 1 වැනි දින එක්සත් ජාතීන්ගේ (UN) මහා සමුළුව මගින් තහවුරු කරන ලද පරිදි 'මානව අයිතිවාසිකම්, නීතියේ පාලනය, යටහ පාලනය සහ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම' සඳහා ස්වාධීන සහ අපක්ෂපාතී අධිකරණයක් පැවතීම අත්‍යවශ්‍ය වන අතර, ශ්‍රී ලංකාව තුළ මෑතකදී සිදු කරන ලද කටයුතු සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය, අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳ එක්සත් ජාතීන්ගේ (UN) මූලික මූලධර්ම, අධිකරණයේ ස්වාධීනත්වයේ මූලධර්ම පිළිබඳ බීජින් ප්‍රකාශනය සහ අධිකරණ ස්වාධීනත්වය පිළිබඳ අන්තර්ජාතික නීතිඥ සංගමයේ අවම සම්මතයන් පැහැදිලිවම උල්ලංඝනය කරනු ලබයි.

ආණ්ඩුවේ පාලන ශාඛා තුන පිළිබඳ පොදු රාජ්‍ය මණ්ඩලීය මූලධර්ම සහ ඒවා ඇතුලත් ලැටිමර් හවුස් (ඛ්ච්සපැර ඍදමි) මාර්ගෝපදේශ පිළිබඳව ශ්‍රී ලංකාවේ නොසැලකිල්ල අන්තර්ජාතික නීතිඥ සංගමයේ මානව අයිතිවාසිකම් ආයතනයේ (IBAHRI) විශේෂ සැලකිල්ලට භාජනය වී ඇත. මෙමඟින්, වෙනත් කරුණු අතර පහත දැක්වෙන දෑ ද දැක්වේ.

- 'ඕනෑම විනය කාර්ය පටිපාටීන් සාධාරණව සහ විෂයමූලිකව ක්‍රියාවෙහි යෙදවිය යුතුය. අධිකරණ නිලධාරියෙක් ඉවත් කිරීම සඳහා විය හැකි විනය කාර්ය පටිපාටීන්ට සාධාරණත්වය තහවුරු කිරීම සඳහා යෝග්‍ය සුරැකිතාවන් ඇතුලත් විය යුතුය.'
- 'යම් විනිසුරුවරයෙක් ඉවත් කිරීමේ අවදානමට භාජනය වී ඇති අවස්ථාවල දී, චෝදනාවන් පිළිබඳව සම්පූර්ණයෙන් දැනගැනීමට, නඩු විභායක දී එම විනිසුරු නියෝජනය කරනු ලැබීම, සම්පූර්ණ විත්තිවාචකයක් ඉදිරිපත් කිරීම සහ ස්වාධීන සහ අපක්ෂපාතී විනිශ්චය මණ්ඩලයක් මඟින් විනිශ්චය කරනු ලැබීම සඳහා එම විනිසුරුට අයිතිය තිබිය යුතුය.'

### *තර්ජනයට ලක් වී ඇති ශ්‍රේෂ්ඨාධිකරණයක්*

බණ්ඩාරනායක අගවිනිසුරුවරිය ඉවත් කර දිනක් ඇතුලත, රාජපක්ෂ ජනාධිපතිවරයා විසින් ඇය වෙනුවට පත් කරනු ලබන තැනැත්තා තෝරා ගෙන තිබුනි. ඔහු තෝරා ගන්නා ලද තැනැත්තා, මොහාන් පීරිස්, ඔහුගේ ආණ්ඩුව සමඟ දැඩි ලෙස සමීප සම්බන්ධතා තිබූ තැනැත්තෙක් විය. මොහාන් පීරිස් මහතා පසුගිය වසර පහ තුළ වැදගත් ධූර රාශියක්ම දරා ඇති අතර, වඩාත් මෑතක දී නීතිපතිවරයා ලෙස සහ අමාත්‍ය මණ්ඩලයේ නීති උපදේශකවරයා ලෙස කටයුතු කර ඇත. ඔහුගේ නව ධූරය ද ජනාධිපතිවරයා වෙත දක්වන ලද අනුග්‍රහය මත ලැබී තිබීම යන කරුණ හේතුවෙන් රට තුළ අධිකරණයේ ස්වාධීනත්වය තවදුරටත් උවදුරෙහි හෙළනු ලබයි. 2013 ජනවාරි මස 7 වැනි දින අභියාචනාධිකරණය විසින් ලබා දුන් තීන්දුව නොසලකා හැරීමෙන්, සහ අවසානයේදී එය අවලංගු කිරීමෙන් දෝෂාභියෝගය නිල වශයෙන් නිත්‍යානුකූල කරනු ලැබිය හැකි බැවින්, ශ්‍රී ලංකා ආණ්ඩුවට සහ මොහාන් පීරිස්ට දැන් ඇත්තේ එක සමාන උනන්දුවකි. මෙහි ප්‍රතිඵලයක් ලෙස, ශ්‍රේෂ්ඨාධිකරණයේ අවංකභාවය දැනටමත් බරපතල ලෙස අන්තරායකට හෙළා ඇති බවට, ලක්ෂණ දක්නට ලැබේ.

අද දක්වාම දෝෂාභියෝගයට සම්බන්ධ නඩු විභාගයේ පාලනය සියතට ගෙන කටයුතු කළ විනිසුරු වන, ශිරානි තිලකවර්ධන විනිසුරුවරිය, බණ්ඩාරනායක අගවිනිසුරුවරිය වරදකරු බවට නියම කළ සභාව ඉදිරියේ සාක්ෂි දීම යන කරුණ අන්තර්ජාතික නීතිඥ සංගමයේ මානව අයිතිවාසිකම් ආයතනයේ (IBAHRI) විශේෂ සැලකිල්ලට භාජනය වී ඇත. ඇගේ සාක්ෂි හුදු ආනුෂංගික පමණක් නොවීයත අගවිනිසුරුවරියගේ වරදකාරීත්වය පිළිබඳව එළැඹුනු බවට කියා සිටින 'නිවැරදි තීරණය' සාධාරණීකරනය කිරීම සඳහා එය ඉතාමත් උපකාරී වූ බවට සභාව විසින් සලකා ඇත. විනිසුරුවන්ගේ පක්ෂපාතීත්වය හුදු විද්‍යාමාන වනවා පමණක් වුව ද, විනිසුරුවන් විසින් කලින් සාක්ෂි දී ඇති කරුණක් සම්බන්ධව කිසිදු භූමිකාවක් රඟ නොදැක්විය යුතු බවට සිද්ධාන්තයක් ඇත. පොදු නීතියට පදනමක් වන්නා වූ සහ අධිකරණ ස්වාධීනත්වය පිළිබඳ අන්තර්ජාතික නීතිඥ සංගමයේ අවම සම්මතයන් සහ අධිකරණ චර්යාව පිළිබඳ බැංගලෝර් මූලධර්ම වැනි අන්තර්ජාතික ලේඛණ මඟින් පිළිගෙන ඇති, මෙම මූලධර්මය, යුක්තිය පසිඳලීමේ ඒකාග්‍රතාවට මූලික වන්නකි. ශ්‍රී ලංකාවේ වර්තමාන ශ්‍රේෂ්ඨාධිකරණය තුළ එය නැවත නැවත උල්ලංඝනය කරනු ලැබ ඇත.

### *නීතිඥ වෘත්තියේ අන්තරායකර තත්ත්වය*

මෑත වසරවල දී, ශ්‍රී ලංකාව තුළ නීතියේ පාලනයේ සෝදාපාළුවීමක් සිදු වී ඇති අතර, මූලික අයිතිවාසිකම්වලට ගරුකිරීමට පක්ෂව කථා කරන සහ එය ප්‍රවර්ධනය කරන නීතිඥයන් බියගන්වන සහ ඔවුන්ට අවමන් කරන ක්‍රමානුකූල උත්සාහයක් ක්‍රියාත්මක වන බව පෙනෙන්නට තිබේ. පසුගිය වසර හය තුළ ජනමාධ්‍යවේදීන් සහ මාධ්‍ය ක්‍රියාකාරීන් විසි දෙදෙනෙක් මරා දමා ඇති අතර, ගිණිය නොහැකි තවත් පිරිසක් අතුරුදහන් වී ඇත. මෙම වාර්තාව රචනා කරනු ලබන මෙම මොහොතේදී පවා, මානව හිමිකම් නීතිඥයෙක් වන ලක්ෂ්මන් ඩයස් පැහැරගැනීමක් බවට සැක කළ හැකි උත්සාහයක් පිළිබඳ බලධාරීන්ට වාර්තා කර ඇති අතරත එමෙන්ම, ඉහළ මට්ටමේ දූෂණ පිළිබඳව ලිපි රචනා කළ ජනමාධ්‍යවේදියෙක් වූ ෆාරාස් ෂවුකතලිට, තිදෙනෙක් විසින් සන්නද්ධ ප්‍රහාරකයන් ඔහුගේ නිවස

තුළ දීම වෙඩි තබා බරපතල ලෙස තුවාල සිදු කර ඇත. මෙම වාර්තාව මගින් දක්වා සිටින ආකාරයට, මෙම කිසිදු අවස්ථාවක් පිළිබඳව සෑහීමකට පත් විය හැකි විමර්ශණයක් සිදු කර නොමැති අතර, ශ්‍රී ලංකාවේ බලධාරීන්ගේ හදිසි අවධානය යොමු විය යුතු නීතිඥයන්ට, ජනමාධ්‍යවේදීන්ට සහ මානව හිමිකම් ක්‍රියාකාරීන්ට එරෙහිව සිදු වූ බරපතල අපරාධ 16ක් එමඟින් හඳුනා ගනී.

මෙම පහරදීම් හුදකලා ඒවා ලෙස සැලකීමට තරම් වන සිදුවීම් නොවේ; ඒවා බණ්ඩාරනායක අගවිනිසුරුවරිය ඉවත් කිරීම සමග අනිවාර්යයෙන්ම බැඳී ඇත. ඇගේ දෝෂාභියෝගයට විරුද්ධව කථා කළ නීතිඥයන්ට එරෙහිව සත්‍ය වශයෙන්ම සිදු වූ සහ එසේ කරනු ලබන බවට තර්ජනය කළ ප්‍රචණ්ඩ සිදුවීම් අවම වශයෙන් හතක්වත් වාර්තා වී ඇත. මෑත කාලීනව නීතිපතිවරයෙක් වූ පත් කරන ලද ඇගේ අනුප්‍රාප්තිකයා විසින්, මේ අතර, මාස 33ක ඔහුගේ ධූර කාලය තුළ නීතිඥයන්ට, ජනමාධ්‍යවේදීන්ට සහ මානව හිමිකම් ක්‍රියාකාරීන්ට එරෙහිව සිදු වූ එකදු අපරාධයකට එරෙහිව හෝ නඩු පැවරීමක් සිදු කර නොමැත. තර්ජනය කිරීම්, පහරදීම්, ගිනි තැබීම්, අතුරුදහන්වීම් සහ මිනීමැරුම්වලට සම්බන්ධ විමර්ශණය කිරීමට මොහාන් පීරිස් අසමත් වූ වැදගත් සිදුවීම් අවම වශයෙන් නවයක් පිළිබඳව වාර්තාවේ සඳහන් වෙයි. මේවා අතුරින් වඩාත් අපකීර්තිමත් සිදුවීම වන්නේ 2010 වසරේ ජනවාරි මස දී ප්‍රදීප් එක්නැලිගොඩ ජනමාධ්‍යවේදියා පැහැරගැනීම සම්බන්ධ සිදුවීමයි; මොහාන් පීරිස් විසින් එක්සත් ජාතීන්ගේ (UN) වධහිංසාවට එරෙහි කමිටුවේ දී ප්‍රසිද්ධියේ පැවසුයේ එක්නැලිගොඩ මහතා පිටරටක ජීවත් වන බවට තොරතුරු ඔහුගේ ආණ්ඩුව සතු වන බවයි, නමුත් ඔහු ශ්‍රී ලංකාවේ අධිකරණයට පැවසුයේ '[[ඔහු] සිටින ස්ථානය දන්නේ දෙවියන් පමණකි' බවයි. රාජ්‍ය නිලධාරීන්ගේ පෞද්ගලික, දේශපාලන හෝ වාණිජ සම්බන්ධතාවන්ට වාසිදායක වන තත්ත්වයන් ඇති, වංචා, පැහැරගැනීම් සහ මිනීමැරුම්වලට සම්බන්ධ ප්‍රධාන නඩු පැවරීම් සහ මූලික අයිතිවාසිකම් පෙත්සම්, පීරිස් මහතා විසින් අත්හිටුවනු ලැබූ අවස්ථා අවම වශයෙන් පහක්වත් විය.

මෙම තත්ත්වයන් යටතේ, ශ්‍රී ලංකාව තුළ අධිකරණයේ ස්වාධීනත්වය බේරාගැනීමට නම් අවංක සහ ක්‍රමානුකූල ප්‍රතිසංස්කරණ අත්‍යවශ්‍ය වේ. පොදු රාජ්‍ය මණ්ඩලීය ප්‍රඥප්තිය වැනි අන්තර්ජාතික ලේඛණ හරහා ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් යහ පාලනය සහ නීතියේ පාලනය වෙනුවෙන් නිලවශයෙන් කැපවී සිටිය ද, නීතිඥයන් සහ මානව හිමිකම් ආරක්ෂකයන් බරපතල තුවාල හෝ මරණය පිළිබඳ තර්ජනවලින් ආරක්ෂා කිරීම සඳහා වූ සිය අතීත වගකීම්වලට ගරු කිරීමට අසමත් වී ඇත. එහි අක්‍රියතාව හේතුවෙන් දුර්විපාක නොලබා සිටීම ඉතා ප්‍රකට දෙයක් වන්නා වූ, හෝ සම්මතය බවට පවා පත්වන්නා වූ දේශපාලන සංස්කෘතියක් බිහිකරනු ලබන බැවින් මෙමගින් දූෂිත ප්‍රතිඵල ඇති වී ඇත.

*සමාප්තිය*

බණ්ඩාරනායක අගවිනිසුරුවරිය ඉවත් කිරීමේ අප්‍රසන්න ප්‍රතිඵල වර්තමාන අර්බුදය මගින් ඇති කර ඇති ආරාවුල් ඉක්මවා යයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට18 වැනි සංශෝධනය සම්මත කර ගැනීමේ සිට විධායකය විසින් ආයතනික සීමාවන් පිළිබඳ එහි බලය කඩා බිඳ දමමින් තිබෙන අතර, වර්තමානයේ ඇති තත්ත්වය යටතේ ජනාධිපතිවරයා විසින් සෘජුවම පත් කරනු ලබන ඕනෑම අගවිනිසුරුවෙක් හට අධිකරණය වෙනුවෙන් විධායකයට විරුද්ධව නැගී සිටීමේ හැකියාවක් නොමැති වනු ඇත. ශ්‍රී ලංකාවේ වසර විසිපහක් පැවති සිවිල් යුද්ධයේ අවසන් අදියරේ දී සිදු වන්නට ඇති යම්කිසි මානව හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳව ආමන්ත්‍රණය කිරීමට එරටට ඇති හැකියාව දෝෂාභියෝගය හේතුවෙන් තවදුරටත් දුර්වල කර ඇත. එවැනි අපයෝජනවල ප්‍රමාණය තක්සේරු කිරීම මෙම වාර්තාවේ විෂයපථය ඉක්මවා යන්නක් වන අතර, එනමුත් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිෂන් සභාව පිහිටුවීම හරහා ශ්‍රී ලංකා ආණ්ඩුව විසින්ම එය සැලකිල්ලට ගැනීමේ අවශ්‍යතාව පිළිගෙන ඇති අතර, මානව හිමිකම් සඳහා වූ එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයා (UN High Commissioner ) විසින් මෑතක දී එය නැවත තහවුරු කරන ලදී. අතීත වැරදි පිළිබඳව සාධාරන සහ අපක්ෂපාතී තක්සේරුවක් කිරීමට, මෙන්ම තිරසර සාමයක් ඇති කර ගැනීමට නම්, කාර්යක්ෂම සහ ස්ථාවර නෛතික පද්ධතියක් ශ්‍රී ලංකාවට අවශ්‍ය වේ. මේ සඳහා ඒකාග්‍රතාවෙන් යුත් ස්වාධීන අධිකරණයක් අවශ්‍ය වේ. ශ්‍රී ලංකාව තුළ එවැනි අධිකරණයක් අඛණ්ඩව ක්‍රියාත්මක විය හැකිද යන්න වැඩි වශයෙන් රඳා පවතින්නේ රඳා පවතින්නේ බණ්ඩාරනායක අගවිනිසුරුවරිය නැවත සේවයේ පිහිටුවීම මගින්, එහි අභියාචනාධිකරණයේ තීන්දුවට ගරු කිරීමට වර්තමාන ආණ්ඩුව සතු කැමැත්ත මතය.

## නිර්දේශ

අන්තර්ජාතික නීතිඥ සංගමයේ මානව අයිතිවාසිකම් ආයතනය (IBAHRI) පහත දැක්වෙන නිර්දේශ ඉදිරිපත් කරනු ලබයි:

**ශ්‍රී ලංකාවේ බලධාරීන් වෙත**

1. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සහ අභියාචනාධිකරණයේ හා ශ්‍රේෂ්ඨාධිකරණයේ වර්තමාන තීන්දුවලට අනුකූල වන පරිදි, දෝෂාභියෝගය සහ බණ්ඩාරනායක අගවිනිසුරුවරිය වෙනුවට කරන ලද පත්කිරීම අවලංගු කිරීමට අවශ්‍ය පියවර වහාම ගැනීම.

2. 78 අ ස්ථාවර නියෝගය දැනටමත් එපමණකින් බලරහිත නොවන බැවින් එම ස්ථාවර නියෝගය ඉවත් කළ යුතු වන අතර, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, පොදු නීති මූලධර්ම සහ අන්තර්ජාතික මානව හිමිකම් නීතිවලට සම්පූර්ණයෙන්ම අනුකූල වන විනිසුරන් සඳහා වූ විනය කාර්ය පටිපාටියක් නිර්මාණය කිරීම සඳහා සැලකිල්ල යොමු කළ යුතුය. එයට ඇතුලත් විය යුතු ලක්ෂණවලට පහත දැක්වෙන දෑ ඇතුලත් වේ:

   (i) විනිසුරුවරයෙක්ට එරෙහිව ඇති නඩුකරයක් මුල් පැමිණිල්ල කරන ලද තැනැත්තන් සහභාගි නොවන විවිධ පුද්ගලයන්ගෙන් සැදුම්ලත් මණ්ඩලයක් මගින් සලකා බලන බව තහවුරු කරන රීති;

   (ii) නිර්දෝෂීභාවයේ පූර්වානුමිතිය සහතික කිරීම;

   (iii) සාක්ෂි රීති සහ ඔප්පු කිරීම් සම්මත පිළිබඳ විධිවිධාන;

   (iv) චෝදනා කරනු ලැබූ විනිසුරුවරයෙක් හට විස්තරාත්මක චෝදනා පිළිබඳව කාලානුරූපී දැනුම්දීමක් ලැබෙන බව, විරුද්ධ සාක්ෂි පිළිබඳ සම්පූර්ණ හෙළදරව්වක්, සහ තමන්ම හෝ නිදහසේ තෝරාග න්නා ලද නෛතික නියෝජනයක් හරහා සාක්ෂිකරුවන්ට මුහුණදීමට සහ සාක්ෂිකරුවන් කැඳවීමට ඇති අයිතිය ලැබෙන බව සහතික කිරීම;

   (v) අදාළ විනිසුරුගේ මතය අනුව විවෘත නඩු විභාගවලට ඇති විධිවිධාන; සහ

   (vi) විනිසුරුවන්ට එරෙහිව ඇති නඩු විභාග අභියාචනාධිකරණයේ විමර්ශනයට සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් අයැදුම්වලට භාජනය වන බව පැහැදිලිව පිළිගැනීම.

3. අධිකරණ චර්යාව පිළිබඳ බැංගලෝර් මූලධර්ම සහ ලැටිමර් හවුස් (Latimer House ) මාර්ගෝපදේශ ඇතුළු, අදාළ අන්තර්ජාතික ලේඛණවල දක්වා ඇති මූලධර්ම සම්පූර්ණව සැලකිල්ලට ගනිමින්, විනිසුරුවන් සඳහා වූ විනය නීති මාලාවක් හදිසි අවශ්‍යතාවක් සහිත කරුණක් ලෙස සලකා සකස් කිරීම.

4. ආණ්ඩුක්රඅම ව්යතවස්ථාවට කරන ලද 18වැනි සංශෝධනය ඉවත් කළ යුතු වන අතර ජනාධිපතිවරයාගෙ න් බැහැර සහ ශ්‍රී ලංකාවේ සියලු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ විනිසුරුවන් පත් කිරීමට වගකීම දරන (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සභාව ලෙස හැඳින් විය හැකි හෝ නොහැකි) මණ්ඩලයක් පත් කිරීමට පියවර ගත යුතුය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ ව්‍යවස්ථාවේ 1වැනි සහ 2වැනි උපලේඛණවල දක්වා ඇති මැතිවරණ කොමිෂන් සභාව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, ජාතික පොලිස් කොමිෂන් සභාව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂනය කිරීමේ නිත්‍ය කොමිෂන් සභාව, මුදල් කොමිෂන් සභාව සහ සීමා නිර්ණය කොමිෂන් සභාවත අගවිනිසුරු සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන්ත අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන්ත අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්; සහ නීතිපතිවරයාත විගණකාධිපතිවරයාත පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන් වරයා සහ පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා නම් නිලධාරීන්, ආයතන සහ විනිසුරන් එහි ප්‍රේෂණය මගින් ආවරණය විය යුතුය.

5. වර්තමානයේදී ශ්‍රී ලංකාව විසින් නොසලකා හරිනු ලබන, ලැටිමර් හවුස් (බීච්සපැර සදමිූ) මාර්ගෝපදේශවල දක්වා ඇති නිරීක්ෂණ අනුව අධිකරණ සේවා කොමිෂන් සභාව අඛණ්ඩව ප්‍රතිසංස්කරණය කළ යුතුය.

6. මෙම වාර්තාවේ තුන්වැනි පරිච්ඡේදයේ දක්නා ඇති විශ්වාසදායක ලෙස චෝදනා නගා ඇති හෝ ඔප්පු කරන ලද බරපතල අපරාධමය සිදුවීම් සියල්ල සම්බන්ධව ලබා ඇති ප්‍රගතිය පිළිබඳව ශ්‍රී ලංකා ආණ්ඩුව ප්‍රකාශ කළ යුතුය. විශේෂයෙන්ම, පහත දැක්වෙන සිදුවීම් විමර්ශණය කිරීමට සහ රැ හෝ ඒ සම්බන්ධව නඩු පැවරීමට ආණ්ඩුව විසින් කර ඇත්තේ කුමක්ද යන්න, සහ, එපමණින් පිළිතුරු කිසිවක් නොවන්නේ නම්, නුදුරු අනාගතයේදී ආණ්ඩුව මගින් කිරීමට යෝජනා කරන විශේෂ වෙනස්කම් මොනවාදැයි පැහැදිලිව ප්‍රකාශ කළ යුතුයඃ

(i) 2008 සැප්තැම්බර් මස 27 වැනි දින මානව හිමිකම් නීතිඥ ජේසී වැලිඅමුණගේ නිවසට එල්ල වූ අත්බෝම්බ ප්‍රහාරය;

(ii) 2008 සැප්තැම්බර් සහ 2009 ජනවාරි මාස අතර සිදු වූ බවට මානව හිමිකම් නීතිඥ අමිත ආරියරත්න සහ එච් ආර් ඩී ජී මෙන්ඩිස් විසින් වාර්තා කරන ලද මරණ තර්ජන සහ ගිනිතැබීම්;

(iii) 2009 ජනවාරි මස 6 වැනි දින මුහුණු ආවරණය කරගත් කුඩා කණ්ඩායමක් විසින් සිරස ටීවී කාර්යාලයට එල්ල කරන ලද බෝම්බ ප්‍රහාරය;

(iv) 2009 ජනවාරි මස 8 වැනි දින, සන්ඩේ ලීඩර් (Sunday Leader) පුවත්පතේ, සංස්කාරක, ලසන්ත වික්‍රමතුංගගේ ඝාතනය;

(v) 2009 ජනවාරි මස 29 වැනි දින පුවත්පත් සංස්කාරක උපාලි තෙන්නකෝන් සහ ඔහුගේ බිරිඳට කරන ලද පහරදීම;

(vi) 2009 මැයි මස 7 වැනි දින හෝ ඊට පසු සිදු වූ මානව හිමිකම් ක්‍රියාකාරී ස්ටීවන් සුන්දරරාජ් පැහැර ගැනීම, අත් අඩංගුවට ගැනීම හෝ මරා දැමීම;

(vii) 2009 ජනවාරි මස 1වැනි දින මාධ්‍යවේදී පෝද්දල ජයන්ත පැහැරගැනීම සහ පහරදීම;

(viii) 2010 ජනවාරි මස මාධ්‍යවේදී පෝද්දල ජයන්ත අතුරුදහන්වීම;

(ix) 2012 ඔක්තෝබර් මස දිසා අධිකරණ විනිසුරු සහ අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්, මංජුල තිලකරත්නට, කරන ලද බරපතල පහරදීම;

(x) 2012 දෙසැම්බර් මස 17 වැනි දින නීතිඥ සහ දෝෂාභියෝගයට විරුද්ධ ක්‍රියාකාරිකයෙක් වූ ගුණරත්න වන්නිනායකට එරෙහිව සිදු කරන ලද තර්ජන;

(xi) 2012 දෙසැම්බර් 20 වැනි දින නීතිඥ සංගමයේ හිටපු සභාපති, ජනාධිපති නීතිඥ (PC), විජේදාස රාජපක්ෂගේ නිවසින් පිටත සිදු වූ වෙඩි තැබීමේ සිදුවීම;

(xii) නීතිඥ සංගමයට (Bar Association) මෑතකදී පත් වූ සභාපති, උපුල් ජයසූරියට එල්ල වූ මරණ තර්ජන;

(xiii) 2013 ජනවාරි මස රොමේෂ් ද සිල්වා ජනාධිපති නීතිඥ (PC), ජයම්පති වික්‍රමරත්න ජනාධිපති නීතිඥ (PC), ජේසී වැලිඅමුණ සහ එම් ඒ සුමන්දිරන් යන නීතිඥවරුන් වෙත යැවූ තර්ජනාත්මක ලිපි;

(xiv) 2013 ජනවාරි මස 23 වැනි දින නීතිඥ නාගානන්ද කොඩිතුවක්කු විසින් වාර්තා කරන ලද මරණ තර්ජන;

(xv) 2013 ජනවාරි මස 15 වැනි දින ජනමාධ්‍යවේදී ෆාරාස් ෂවුකෙතලිට කරන ලද වෙඩි තැබීම;

(xvi) 2013 පෙබරවාරි මස 25 වැනි දින මානව හිමිකම් නීතිඥ ලක්ෂාන් ඩයස් විසින් තර්ජනාත්මක මෝටර් බයිසිකල්කරුවන් සහ සුදු වෑන් රථයක සිටි තැනැත්තන් සම්බන්ධව කරන ලද පොලිස් පැමිණිල්ල.

විදේශ ආණ්ඩුවලට සහ රාජ්‍ය නොවන ආයතනවලට

7. (ඉහත දක්වන ලද 4 වැනි නිර්දේශ යටතේ දක්වන ලද) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18වැනි සංශෝධනය යටතේ ජනාධිපතිවරයා විසින් සෘජුවම පත් කරනු ලබන නිලධාරීන් සහ ආයතන වෙත සහාය පළ කිරීමට ඉදිරිපත්වීමේ දී සැලකිලිමත් විය යුතුය. ශ්‍රී ලංකාවේ නීතිඥයන් සහ විනිශ්චයකාරවරයන් පුහුණු කිරීමට හෝ ඔවුන්ට වෙනත් ආකාරයකින් සහාය දීමට වූ උත්සාහයන්වලින් තවදුරටත් බලතල බෙදීමේ මූලධර්ම සෝදාපාළු නොවිය යුතු අතර, තෝරා පත් කර ගත්, නියෝජක, සහ විධායකයෙන් සම්පූර්ණයෙන්ම නිදහස් වෘත්තිය සංවිධාන කෙරෙහි යොමු විය යුතුය.

8. ඉහත, 6වැනි නිර්දේශවල දක්වා ඇති නීතිඥයන්ට, ජනමාධ්‍යවේදීන්ට සහ මානව හිමිකම් ආරක්ෂකයන්ට විරුද්ධව සිදු කරනු ලබන අපරාධ ඇතුළුව, ශ්‍රී ලංකාව තුළ විමර්ශණය නොකර ඇති, බොහෝ පහරදීම්, පැහැරගැනීම්, වධහිංසා කිරීමේ සහ මිනීමැරීමේ ක්‍රියා විසඳීම සඳහා අන්තර්ජාතික ආණ්ඩු සහ නීති ක්‍රියාත්මක කරන ආයතනවලට ශ්‍රී ලංකාවට උපකාර කළ හැක්කේ කෙසේදැයි නිශ්චිතව දැක්වීමට ශ්‍රී ලංකා ආණ්ඩුවට ආරාධනා කළ යුතුය.

එක්සත් ජාතීන්ගේ සංවිධානයට, පොදුරාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලයට, පොදු රාජ්‍ය මණ්ඩලීය අමාත්‍ය ක්‍රියාකාරී කණ්ඩායමට සහ පොදු රාජ්‍ය මණ්ඩලයේ සාමාජික රටවල් වෙත

9. ඉහත දක්වන ලද නිර්දේශවලට අනුකූලවන ප්‍රතිසංස්කරණ ප්‍රවර්ධනය කරන්නා වූ පරිශ්‍රමයන් වඩා බලවත් කළ යුතු වන අතර, එවැනි ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා ආණ්ඩුවට අවශ්‍ය වන්නේ කුමන සහායන්දැයි නිශ්චිතව දැක්වීම සඳහා ශ්‍රී ලංකා ආණ්ඩුවට ආරාධනා කළ යුතුය. විනිශ්චයකරුවන්ගේ සහ නීතිඥයන්ගේ ස්වාධීනත්වය පිළිබඳ එක්සත්ජාතීන්ගේ (UN) විශේෂ වාර්තාකරු, මානව හිමිකම් ආරක්ෂකයන්ගේ තත්ත්වය පිළිබඳ එක්සත්ජාතීන්ගේ (UN) ɥශේෂ වාර්තාකරු, සහ බලයෙන් කරවනු ලබන හෝ නිරුත්සාහක අතුරුදහන් කිරීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ (UN) ක්‍රියාකාරී කණ්ඩායම විසින් කරනු ලබන අනාගත සංචාරවලදී ඔවුන්ට පහසුකම් සපයන්නේ කෙසේද, සහ ඔවුන් සමග සහයෝගයෙන් කටයුතු කරන්නේ කෙසේද, යන්න පිළිබඳව ආණ්ඩුවෙන් විමසිය යුතුය.

10. ශ්‍රී ලංකා බලධාරීන් විසින් මෙම නිර්දේශ කොතරම් බලපතල ලෙස භාර ගන්නේ ද යන්න පොදුරාජ්‍ය මණ්ඩලය මඟින් තක්සේරු කළ යුතු වන අතර, ඒවා සම්බන්ධව කටයුතු කරනු ලබන ඉක්මන අධීක්ෂණය කළ යුතුය, එමෙන්ම එමඟින් පහත දැක්වෙන කරුණු ඉතා සුපරීක්ෂාකාරීව සැලකිල්ලට ගත යුතුයඃ

    (i) ඔවුන් විසින් එම ප්‍රඥප්තියේ දක්වා ඇති බලතල බෙදීම, නීතියේ පාලනය, යහ පාලනය සහ මානව හිමිකම් සඳහා ගරු කිරීම ඇතුළු, එහි මූලික වටිනාකම් සහ මූලධර්මවලට ගරු කරන්නේදයි;

    (ii) ශ්‍රී ලංකාව ඉදිරියේදී පැවැත්වීමට නියමිත පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක රැස්වීමේ දී සත්කාරකත්වය දැරීමෙන් සහ ඉදිරි වසර දෙක සඳහා එහි සභාපති වශයෙන් කටයුතු කිරීමෙන් පොදුරාජ්‍ය මණ්ඩලයේ කීර්ති නාමය තවදුරටත් වැඩිදියුණු වන්නේද නැතිනම් එය පළුද වන්නේද යන්න.

**International Bar Association**
4th Floor, 10 St Bride Street
London EC4A 4AD, United Kingdom
දුරකථනඃ +44 (0)20 7842 0090
ෆැක්ස්ඃ +44 (0)20 7842 0091
වෙබ් අඩවියඃ **www.ibanet.org**